# <u>උපාධි ලෝගු, මාල හා උපාධි හිස්වැසුම් ලබා ගැනිම සහ පෙරහැර අංක නිකුත් කිරිම</u>

1. උපාධි ප්‍රදානෝත්සවයේ දී උපාධිලාභීන්ට පැළඳීම සඳහා අවශ්‍ය උපාධි ලෝගු, මාල සහ උපාධි හිස්වැසුම් 2024 දෙසැම්බර් මස 06 වැනි දින රුහුණ විශ්වවිද්‍යාලයේ දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකයේ දී නිකුත් කිරීමට කටයුතු යොදා ඇත. ඊට අදාල තොරතුරු අදාල **ඇමුණුම් 01 (Annex 01)** හරහා ලබාගත හැකි අතර අදාළ වෙන් කරන ලද කාළය තුළදී පැමිණිය යුතුය.

   ලෝගු නිකුත් කිරීමට නියමිත දිනය : 2024.12.06

   ලෝගු නිකුත් කිරීමට නියමිත වේලාව : පෙ.ව. 09.00 සිට ප.ව. 02.00

   ස්ථානය : දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය/ රුහුණ විශ්වවිද්‍යාලය

2. උපාධි ලෝගු. මාලා හා හිස් වැසුම් ලබා ගැනීම සඳහා ඊට අදාළ අයදුම්පත ද ස්වකීය අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා විශ්ව විද්‍යාලය මඟින් නිකුත් කර ඇති ශිෂ්‍ය වාර්තා පොත හෝ ශිෂ්‍ය හැඳුනුම්පත් උපාධි ලෝගු නිකුත් කරන නිලධාරි වෙත ඉදිරිපත් කළ යුතු ය.

3. උපාධි ලෝගු, මාල සහ හිස් වැසුම් ලබා ගැනීමට පැමිණීමට පෙර දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකයහි වෙබ් අඩවියෙහි (https://www.dceu.ruh.ac.lk/convocation.php) ඇති ප්‍රශ්නාවලිය සම්පූර්ණ කළ යුතු ය. එය සම්පූර්ණ කිරීමෙන් පසු ඔබට උපාධි ප්‍රදානෝත්සවය සඳහා ලියාපදිංචි වූ වෙබ් අඩවිය (https://paravi.ruh.ac.lk/convocation) හරහා ලෝගු මාල සහ හිස් වැසුම් ලබා ගැනීම භාර දීම සඳහා වන අයදුම්පත බාගත (download) කළ හැකි අතර, එහි මුද්‍රිත පිටපතක් අදාළ දින රැගෙන පැමිණිය යුතුය.

   සැලකිය යුතුයි: ප්‍රශ්නාවලිය හා අදාළ ගෙවීම් සම්පූර්ණ කිරීමෙන් පසුව පමණක් ලෝගු, මාල සහ හිස් වැසුම් ලබා ගැනීම භාර දීමට අදාළ අයදුම්පත බාගත (download) කළ හැකිය.

4. හැඳුනුම්පතක් නොමැති අයෙකු වෙතොත් ස්වකීය අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා විශ්ව විද්‍යාලයට පිළිගත හැකි වෙනත් අනන්‍යතා සහතිකයක් රැගෙන පැමිණිය යුතුය.

5. උපාධි ප්‍රදානෝත්සවය ශාලාව තුළ සහ උපාධි ඡායාරූප ගැනීමට අවශ්‍ය කටයුතු සඳහා විශ්වවිද්‍යාලය විසින් නම් කරනු ලබන ඡායාරූප/ වීඩියෝ ශිල්පීන් මඟින් පමණක් සිදු කරනු ලබන අතර විශ්වවිද්‍යාලය විසින් ඒ සඳහා අවස්ථාව සලසා ඇති අතර <u>ලෝගු නිකුත් කරනු ලබන දිනයෙහි රුහුණ විශ්වවිද්‍යාලයේ ගෘහස්ථ ක්‍රිඩාගාරය තුලදී අදාල ඡායාරූප ශිල්පීන් හමු විය හැකිය.</u> ඡායාරූප ප්‍රමාණයන්ට අදාළ අනුමත මිල දර්ශන ඇමුණුම 02 **(Annex 02)** හි සඳහන් කර ඇත.

6. උපාධි ප්‍රදානෝත්සවය පැවැත්වෙන දිනයේ දී **<u>හෝ</u>** උපාධි ප්‍රදානෝත්සවය නිම වී සති දෙකක් ඇතුළත උපාධි ලෝගුව, මාලය සහ හිස් වැසුම මේ සමඟ ඇති අයදුම්පත මඟින් භාරගන්නා නිලධාරී/ ගබඩා භාරකරු වෙත භාර දී අදාළ රිසිට්පත ලබාගත යුතු අතර, එසේ භාරදුන් බවට ශිෂ්‍ය වාර්තා පොතෙහි ද සහතික කර ගත යුතුය.

7. නියමිත කාල සීමාව ඉකුත් වීමෙන් අනතුරුව උපාධි ලෝගුව, මාලය සහ උපාධි හිස් වැසුම භාරදීම ප්‍රමාද වන සෑම දිනයක් සඳහාම දිනකට රු. 250/= බැගින් වන ප්‍රමාද ගාස්තුවක් අයකරනු ලබයි.

8. ඔබ වෙත නිකුත් කරන ලද උපාධි ලෝගුව, මාලය සහ උපාධි හිස් වැසුම ඔබ භාරයේ තිබිය දී යම් අලාභයක් හෝ හානියක් සිදු වී ඇත්නම් ඒවායේ සම්පූර්ණ වටිනාකම හා ඊට අතිරේක ව එම වටිනාකමින් 25%ක ගාස්තුවක් ගෙවිය යුතු වේ.

9. උපාධි ලෝගුව, මාලය සහ උපාධි හිස් වැසුම භාරදුන් බවට ලබාගත් රිසිට්පත උපාධි සහතික නිකුත් කරනු ලබන නිලධාරී වෙත ඉදිරිපත් කිරීමෙන් පසු ඔබ හට උපාධි ප්‍රදානෝත්සව දිනයේදීම එනම් 2024.12.13 දින ප.ව. 07.00 සිට ප.ව. 10.00 දක්වා දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකයේදී උපාධි සහතිකය ලබා ගත හැකිය. ඊට අදාල තොරතුරු අදාල **ඇමුණුම් 03 (Annex 03)** හරහා ලබාගත හැකිය.